ඉබි තටුවෙන් පියාඹන්න

(ලංකා ඊ නිව්ස්, 2008 මාර්තු. 06 ප.ව. 3.50 -ප්‍රගීත් එක්නැලිගොඩගේ කතිකාවකි-) නැගෙනහිර පළාතේ පළාත් පාලන ඡන්ද විමසීම මෙම මස දහවන දින අවසන් වේ. එහේ සාධාරණ ඡන්දයක් පැවැත්වෙන්නේ නැතැයි කියා එජාපය මෙම මැතිවරණයට ඉදිරිපත් වූයේ නැත. එහෙත් මුස්ලිම් කොන්ග්‍රසයත් කුඩා පක්ෂ කිහිපයකුත් නාම යෝජනා බාර දුන්හ. දෙමළ ජාතියේ නිදහස වෙනුවෙන් සන්නද්ධ අරගලයක නිරතවී සිටි පිරිසක් මෙම පළාත් පාලන චන්දයට ඉදිරිපත් වී සිටීම විශේෂත්වයකි. ආණ්ඩුව (ශ්‍රිලනිපය) එම පිරිස සමග සංධානගත වී සිටීම ඊටත් වඩා විශේෂත්වයකි. ඒ පිරිස නම් පිල්ලෙයාන් කණ්ඩායම හෙවත් දෙමළ ජනතා විමුක්ති කොටි (ටීඑම්වීපි) ය. නැගෙන හිර පළාතේ දෙමළ ජනයාගෙන් 30 000 ක් පමණ දෙනා මෙතෙක් ඒ නිදහස් සටන වෙනුවෙන් දිවි දී ඇතැයි කියති. එබැවින් ගම් පිටින් ස්ත්‍රීන් වැන්දඹුවන් වී ඇතැයි ද වාර්තා වේ. ඔවුන් එසේ තම ජන්මභූමියේ නිදහස වෙනුවෙන් ජීවිත - දේපොල කැපකොට ඇතත් දැන් ඒ ජන්ම භූමිය තබා පළාත් සභාවක් තරම්වත් බලයක් නැති ප්‍රාදේශීය සභා වලින් සෑහීමකට පත් වීමට ඒ අය තීරණය කර ඇති සැටියක් නැගෙනහිර පළාතෙන් දැනගන්නට ඇත. මේ තිබෙන හැටි ද නැත්නම් පේන හැටි ද කියා දැන්ම කියන්නට බැරි වුනත් පසුවට දැන ගත හැකිවනු ඇත.

ඒ කොයිහැටි වෙතත් මෙම පළාත් පාලන ඡන්ද විමසීම ආණ්ඩුවේත් ටීඑම්වීපි යේත් ලිට්මස් අගය හෙළිදරව් වන අවස්ථාවක් වනු ඇත. එපමණක් ම නොවේ ටීයුඑල්එෆ් නායක වී ආනන්ද සංගරී මහතාත් කලක් තිස්සේ 'ලංකාදීප' පුවත්පතට උතුර-දකුණ නම් තීරු ලිපිය සම්පාදනය කරන තිසරණී ගුණසේකර මෙනවිය ත් දිගින් දිගටම අවධාරණය කොට සිටින ලංකාවේ වාර්ගික ප්‍රශ්ණය විසඳන එක්තරා සංකල්පයක් මෙ මගින් පරීක්ෂණයට ලක්වීමට නියමිතය. ඒ පීඩකයා ලවා තම සටන චප්ප කරවා ගන්නා අතරේම සටනේ උතුම් අරමුණ ඒ පීඩකයාගෙන්ම ලබා ගැනීමේ අමුතුම දයලෙක්තික ක්‍රමයකි. එම සංකල්පය කඩුව සතුරාට දී කඩු කොපුව තමන් වෙත තබාගෙන කළා යැයි කියන අර චුල්ල ධනුද්ධර ජාතකයේ එන පෙම් සටන වැනි අමුතු උපායකි. පළමුව අයිතිවාසිකම් ලබා දී දෙවනුව මර්දනය කිරීම හෝ පළමුව මර්දනය කොට දෙවනුව නිදහස දීම යන සූත්‍ර දෙකෙන් කොයි එක හරි වැඩ කරන හැටි ඉදිරියේ දී බලා ගත හැකි වනු ඇත.

ඔවුන් දෙපල කුමක් අවධාරණය කරනු ලැබුවෝ ද? ඔවුන් දෙදෙනගේ දේශපාලන සූත්‍රය කුමක් ද?.

දෙමළ වීම නිසාම දෙමළ ජනතාවට සුවිශේෂ වාර්ගික පීඩනයක් ඇතැයි මෙම දෙ දෙනම පිලිගනිති. එම පීඩනයෙන් දෙමළ ජනයා නිදහස් විය යුතු බවත් පිලිගනිති. එල්ටීටීඊය එහි පැවැත්මට යොදාගෙන ඇත්තේ එම වාර්ගික පීඩනය යැයි ද කියති. තමන් විඳින පීඩනය ඉවසන්නට බැරිම තැන ඉන් නිදහස් වීමට එම ජනතාව වෙන මගක් නැති නිසා (සියලු ප්‍රජාතන්ත්‍ර මාර්ග ආණ්ඩුව විසින් අවුරා ඇති නිසා) එල්ටීටීඊයේ පිහිට පතන බව ද කියති. එම නිසා එල්ටීටීඊය පැරදවීමට නම් දෙමළ සමාජය සමග එයට ඇති සම්බන්ධය කැඩිය යුතුය - සහයෝගය ඇල්ම බැල්ම මකා දැමිය යුතුය - එමගින් එල් ටී ටී ඊය හුදෙකලා කළයුතු ය යැයි කියති. දෙමළ ජනයාට සෑහීමකට පත්විය හැකි තරමේ විසඳුමක් ලබාදීම මගින් එල්ටීටීඊය හුදකලා කළ හැකි බවත් ඔවුන් දෙදෙනාගේම විශ්වාසය ය. සෑහෙන විසඳුමක් නැතිව මිලිටරි බලයම යොදවන්නට යාමෙන් තව තවත් දෙමළ ජනතාව පීඩනයට පත්ව පිහිට පතා එල්ටීටීඊය වෙතම එකතුවීමෙන් එය තව තවත් ශක්තිමත් වන බවත් ඒ නිසා මිලිටරි සත්කාරය පමණක් ම යොදා ගැනීමෙන් අරමුණ ජය ගත නොහැකි බවත් ඔවුන්ගේ අදහසය. (මෙතරම් පැහැදිලිව නොවුනත් මෙම අදහසම දරන සැලකිය යුතු තවත් පිරිසක් රටේ සිටිති.) එල්ටීටීඊය සම්බන්ධයෙන් ඔවුන් දෙ දෙන කියන මෙම තර්ක පෙළ සහ නිගමන සාමාන්‍ය වශයෙන් සිහි බුද්ධිය ඇති ඕනෑම අයෙකු පිලිගන්නා බවට සැකයක් නැත.

ඒත් ඉතින් බැරැක්ක සමාජයත් බුද්ධිමය සමාජයේ බහුතරයකුත් දේශපාලන සමාජයේ බහුතරයකුත් එය පිළි නොගන්නේ ඇයි? සමස්ථ ලංකා සිංහල සමාජයම ජාතියට අවනම්බුවක් ගෙන දෙන මේ බැරි වැඩේ වටේම ධාවනය වන්නේ ඇයි?. මෙය බැරි වැඩක් යැයි කීවත් නැගෙනහිර පළාතේ දී සාර්ථක ප්‍රතිඵල අත්කරගෙන ඇතැයි කියන හෙයින් පීඩිත වාර්ගික ත්‍රස්තවාදයක් මිලිටරි සත්කාරයකින් විසැඳීමට හැකි බව පළමුව ලොවට පෙන්නා ඊශ්‍රායෙල් කාරයන්ට කලින් ගිනස් පොතට නම ඇතුල් කර ගැනීමට බැරැක්ක සමාජයේ හා දේශපාලන සමාජයේ නායකයන් සිතන නිසාවත්ද.

එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයන් යනු මනුෂ්‍යයින් මිස සුවිශේෂ මැජික් බලයක් ඇති සත්ත්ව කොට්ඨාශයක් නොවේ. ඔවුන්ට ද ඇත්තේ අනෙක් මිනිසුනට ඇති කාබනික ශරීරයමය. ජන සමාජයක් තුලින් උපන් පොදු චිත්තවේදනාවක් හා එම වේදනාවම සංවිධාන ගත ශක්තියක් බවට හරවා ගැනීමක් හැරුණු කොට වෙනත් ගුප්ත බලයක් ඔවුන් සතුව නැත. තිසරණී ගුණසේකර

මෙනවියත් ආනන්ද සංගරී මහතාත් පුන පුනා කියා සිටින්නේ අන්න ඒ ශක්තිය එල්ටීටීඊ යෙන් ඉවත් කළ යුතු බවය. දේශපාලන විසඳුම වුවමනා කරන්නේ ඒ සඳහාය. ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු වන ඩිලාන් පෙරේරා මහතා ද එතරම් ම වෙනසක් නැතිව මෙම අදහසම දරමින් කලක සිට ආණ්ඩුව ඇතුළේ සිට ආණ්ඩුවෙන් ද රටේ ජනතාවගෙන් ද එම අදහසට ඇහුම්කම් දෙන ලෙස ඉල්ලා සිටී. මෙම න්‍යාය වාර්ගික පීඩනය හා මර්දනය වඩාත් සූක්ෂ්ම ආකාරයෙන් පවත්වාගෙන යාහැකි දියුණු ඉන්ද්‍රජාලික උපක්‍රමයක් බව පැහැදිලිය. එහෙත් සියල්ල දත් චම්පික රණවක මහතාට හෝ ජවිපෙට නොවැටහීම නම් පුදුමයක්ම තමයි. ඒ ඔවුන්ගේ දැනුමේ තරමය. නො එසේ නම් සිහළ උරුමය සිය දේශපාලන මග පෙන්වන්නා බවට ඩිලාන් පෙරේරා මහතා පත් කර ගනු නිසැකය. අර්බුදයට විසැඳුමක් වුවත් නැතත් ඩිලාන් පෙරේරා මහතා ඇතුලු සාම උපක්‍රමිකවාදීන් ගේ මෙම දේශපාලන ඔපෙරාව චම්පික මහතා ඇතුලු ග්‍රාම්‍ය සිංහලෝත්තම වාදීන්ගේ සිංහබාහු නාඩගමට වඩා සොෆිස්ටිකේටි බව නම් කිව යුතුමය.

ඇත්තෙන්ම උපක්‍රමයක් ගිණි ගෙඩියක් ආදී වශයෙන් කුහක වංචනික අරමුණකින් තොරව විශ්වාසයක් ඇතිවන හැටියකට වාර්ගික දූරාවලිය තුරන් වන ආකාරයේ විසඳුමක් ඉදිරිපත් කරන්නට සමත්වුවහොත් ඉන් පසු එල්ටීටීඊ සංවිධානයේ පැවැත්මේ අවකාශය අතුරුදන් වනු ඇත. මරාගෙන මැරෙන චිත්තවේගය සිසිල් වී මැකී යනු ඇත අවි දරාගෙන සිටීමේ අරුත පහ වී ගොස් ව්‍යවසායික ආශාවන් පිබිදෙනු ඇත. ඒ ඔවුන් ද එල්ටීටීඊ ගරිල්ලන් ලෞකික ආශාවන්ගෙන් යුක්ත පෘතග්ජන මිනිසුන් නිසාය. ඉන් පසු පරාජය කිරීමට හෝ චප්ප කිරීමට එල්ටීටීඊයක් ද ඉතුරු නොවනු ඇත. එබඳු අවශ්‍යතාවයක් ද දේශපාලන අවකාශය තුළ ඉතිරි නොවනු ඇත. එකිනෙකාගෙන් වාඩුව පිරිමසා ගැනීමේ වුවමනාව පහවී යනු ඇත. වාර්ගික ගැටලු ඇති හැම තැනකම එය විසැඳුනු හැම තැනකම, තත්ත්වය එබඳුය. නමුත් ඒවා මේ කියන වේගයෙන් විසඳෙන්නේ නැත. බාධක මැද ටිකෙන් ටික විසැඳෙන්නේ හෙමි හෙමින්ය. එයට ඉවසීමේ ශීලාචාරකම අවශ්‍යය. ඉතින් ඔච්චර අපූරු ප්‍රජාතන්ත්‍රවාදී (ඇත්තෙන්ම නියම දේශපාලන මිලිටරි විසඳුම) විසඳුමක් තිබෙද්දී මේ පාලකයන් එය පිළිනොගන්නේ ඇයි?. සිංහළ ජන සමාජය මෙන්ම ඒ ජන සමාජයේම සාමාන්‍ය මිනිසෙකුවන මහින්ද රාජපක්ෂ මහතාද පැය විසිහතරෙන් ලබාදෙන විසඳුම්වලට හුරු පුරුදු වී සිටින නිසා හෙමි හෙමින් කෙරෙන දේවල් දෙස මඳුරුවන් තල තලා බලා ඉන්නට බැරි නිසාවත්ද?.

තම ජනසමාජයේ කාරුණික සහයෝගය නොමැතිව එල්ටීටීඊය ට පවතින්නට නොහැකිය. මිශ්‍ර වාර්ගික පරිසරයක් ඇති නැගෙනහිර පළාතේ දී එම කාරුණික සහයෝගය හීන වීමේ ප්‍රමාණයට එහි ක්‍රියා කාරීත්වයද දුර්වලවන්නේ එහෙයිනි. විවිධ ආණ්ඩු යටතේ ඒ බව සනාථ වී තිබේ. ඒත් ඉතින් මෙච්චර කාලයක් ඔය ඔච්චර අගනා මිලිටරි උපදේශය මහින්ද රාජපක්ෂ මහතා පිලිනොගත්තේ ඇයි?. ආනන්ද සංගරී මහතාත් තිසරණී ගුණසේකර මෙනවියත් අර ඩිලාන් පෙරේරා කැබිනට් නොවන ඇමතිවරයාත් කෙරෙහි මොකක් හරි අවිශ්වසයක්වත් නිසාද ?. නීතියක් බවට පත් වී අවුරුදු විස්සක් විතර කාලයක් තිස්සේ හොඳට පදම් වී ඇති 13 වන ආණ්ඩුක්‍රම සංශෝධනයට පවා තමන් කැමැති නැති බව මහින්ද රාජපක්ෂ මහතා මෑතක දී කිව්වායැයි කියන්නේ ඇයි ?. ( ඔය අනික් කට්ටිය සේරම කියනවානම් මම ඉතිං ඕක කරන්නම් හැබැයි මං නම් ඕකට එදා ඉඳලම විරුද්දයි කියා ජනාධිපති වරයා කීවේ යැයි පුවත් පත් වාර්තා කොට තිබිණ. )

කෙසේ නමුත් මහින්ද රාජපක්ෂ මහතාගේ අදහස නිරවුල්ය. චම්පික රණවක මහතාගේ අදහස තරම්ම නිරවුල්ය. පැහැදිලිය. අවංකය. ජවිපෙ මෙන් බොරු සමාජවාදයක් පටලවාගෙන සමයං දෙඩවිල්ලක් නැත. අමාත්‍ය ඩිලාන් පෙරේරා හා වාසුදේව සහෝදරයා මෙන් මිලිටරි ජයග්‍රහණය රැකගැනීමට ඊනියා සාමය යොදා ගැනීමේ ඉන්ද්‍රජාලික කුහක න්‍යාය (සාමය සඳහා යුද්ධය -යුද්ධය සඳහා සාමය) මෙන් වංචනික ද නැත.

එය සරලයෘ කෙටියෙන් කියනවානම් එය මෙසේය.

වියදම් කොට යුද්ධයක් කරන්නේ සතුරා යටත් කරන්නට මිස ඔහු ඉල්ලන දේවල් දෙන්නට නොවේ. ඔය කියන විදියට බලය බෙදාදීමට නම් යුද්ධ කරන්නට අවශ්‍ය නැත. එය නොකරම ඉල්ලන දේ දීලා දමන්නට පුලුවන්ය. සතුරා සමූලඝාතනය කොට මිලිටරි බලය සුන් කොට නීතිය හා සාමය තහවුරු කිරීම සිංහළයා ගේ අපේක්ෂාවය. දුටුගැමුණු කුමරු අතීතයේදී කළේ එය ය. දැනුදු අප කළ යුතුව තිබෙන්නේ එය ය. ගහගෙන ගහගෙන පේදුරු තුඩුවටම ගියානම් වැඩේ කම්මුතුය. මෙය නොකර හිටියෝතින් කවදාහරි උන් අපට පහර දෙන බැවින් සිංහළයාට දෙවුන්දර තුඩුවෙන් මුහුදට පැන මිය යන්නට සිදුවන්නේය. කවුරු කවුරුත් බලයට පැමිණ නොකර සිටියේ එයයි. එයට මේ බලය බෙදීමද මොකද්ද වැඩකට නැති එන්ජිඕ කෙහෙල්මල පටලවා ගත යුතු නැත. ඉතින් මේ අවසන් ජයග්‍රහණය අත ළග ඇති වේලාවේ ඔය 13 වන සංශෝධනය අල්ලලා පැත්තකට දැමිය යුතුය.

මේ පෘතග්ජන සිංහල මනුෂ්‍යයෙකු සාමාන්‍ය වශයෙන් සිතන පිළිවෙලය. වර්තමාන ලෝකයේ පිළිවෙල ඈත ඉතිහාසයට වඩා වෙනස් බවත් දුටුගැමුණු කුමරු සටන් කළ කාලයේ මෙන් මිලිටරි බලයෙන්ම සිවිල් සන්නද්ධ ගැටුම් කළමනාකරණය කළ නොහැකි බවත් සාමාන්‍ය පුරවැසියා දන්නේ නැත. ගහගෙන ගහගෙන ගොස් පේදුරු තුඩුවෙන් මුහුදට වැටෙනතුරු දෙමළ කරදරේ තල්ලු කරන්නට බැරුවා මෙන්ම සිංහළයා දෙවුන්දරින් මුහුදට තල්ලු කරන්නට දෙමළ ජාතියට පුලුවන්කමක් ඇත්තේ ද නැති බව ඔවුන් දන්නේ නැත. ඒවා හැගීම්බර මිනිසුන් කියන අතිශයෝක්ති කතා පමණය. රටේ විධායක ජනාධිපතිවරයා වුවත් පෙනෙන හැටියට මහින්ද රාජපක්ෂ මහතා ද සිතන මතන පිළිවෙලද එබඳු ය. එහෙම නොවේ නම් මේ දැන් තිබෙන ව්‍යවස්ථාව ට අනුව දිවුරුම් දී ඒ ව්‍යවස්ථාවේම නීතියක් බවට පත්ව ඇති 13 වන ආණ්ඩුක්‍රම සංශෝධනය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා හැටියට අර වැනි ප්‍රකාශයක් එතුමා කරන්නේ නැත. එතුමා මෙම වාර්ගික සන්නද්ධ ගැටුම ගණන් ගෙන ඇත්තේ පරණ ගොපලු සිනමාවේ එන නරක චණ්ඩි රැළකගේ නොපනත් කමක් හැටියට විය යුතුය. පිචර්වල නම් චණ්ඩින්ගේ මහ එකා අවසන් කළ පසු වැඩේ අහවරය. ඊට අවශ්‍ය වන්නේ ක්ලිනට් ඊස්ට්වුඩ් - ජුලියානෝ ජෙම්මා - චක්නොරිස් - මඩාටුවේ අප්පුහාමි - සරදියෙල් - වැනි වීර පුතුන් පමණය. මෙවන් නිධන්ගත සමාජ ගැටුම් සියුම් ලෙස අධ්‍යයනය නො කළ විට ඕනෑම අයෙකු ට සිතෙන්නේ එසේය.

ආනන්ද සංගරී මහතා සහ ගුණසේකර මෙනවිය මේ ගැන කියන්නට පෙර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා මහතා 13 වන ආණ්ඩුක්‍රම සංශෝධනයේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරන්නැයි කියා කියන්නේ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ පාලන කාලයේ සිට ම බවත් ඒත් එය ක්‍රියාත්මක කරගන්නට බැරිවුණ බවත් මෙහිලා සිහිපත් කළ යුතුය. එමෙන් ම දොස්තර තිස්ස විතාරණ සහෝදරයා මෙතෙක්කල් කුණු බැනුම් අසමින් අර සර්වපාක්ෂික උපදේශණ සභාව නම් තේ මේසය පවත්වාගෙන ගිය එකේ කිසිම තේරුමක් නැති බවක් පෙනුනත් ඒ තේ මේසය ද පවත්වාගෙන ගියේ අර මානුෂික මෙහෙයුමේ ම කොටසක් වශයෙන් ලෝකයා රැවැට්ටීමටම නොවේදැයි කියා දැන්වත් අවබෝධකරගත යුතුය.

ආනන්ද සංගරී මහතා ට එල්ටීටීඊය තම අංක එකේ සතුරා යෟ ඒ ඔහුගේ දේශපාලන පැවැත්මට එල්ටීටීඊය බාධකයක් බැවිනි. දෙමළ ජාතිය මුහුනපාන අර ජනවාර්ගික ප්‍රශ්ණය ට සෑහෙන විසඳුමක් ලබා ගත යුතු වුවත් ඒ අතරේ එල්ටීටීඊය ද සමූලෝත්පාථනය විය යුතු බව එතුමාගේ වුවමනාවය. මහින්ද රාජපක්ෂ මහතාත් එතුමාගේ ලේකම්වරයාත් යන දෙදෙනාටම ද සමස්ථ ලංකා සිංහළ සමාජයටද එල්ටීටීඊය සමූලෝපාථනය කිරීම අවශ්‍යය. එහෙත් ඉන්පසු කිසිවක් දෙමලුන්ට දෙන්නටනම් ඔවුනට නොහැකිය. ඇබිත්තක්වත් බලය බෙදාගන්නා විසඳුමක් ගැන කතාකරන්නවත් කැමැති නැත්තේ එනිසා නොවේද?.

ඉබ්බාට පිහාටු නැත. ජුරාසික යුගයේ සිට පැවත එන මේ උභය ජීවියා ගෙන් පිහාටු ඉල්ලා සිටීම විකාරයකි. නොලැබෙන දෙයක් වෙනුවෙන් කරන යැදීම ට උදාහරණයට ගන්නේ ඉබ්බාගෙන් පිහාටු ඉල්ලීමය. තිසරණී ගුණසේකර යනු වසර 15 ක් 20 ක් තිස්සේ සිට ශ්‍රී ලංකාවේ සමාජ ගැටුම් කෙරෙහි සිය තීක්ෂණ අවධානය යොමු කොට ඒවා අධ්‍යයනය කරන තැනැත්තියකි. ඇය එම කාර්ය ආරම්භ කරන්නට වූයේ සිසුවියක් වශයෙන් සිටියදී ම බව මාගේ විශ්වාසයයි. ඇය පැහැදිලි ලෙසම එල් ටී ටී ඊ සංවිධානය මිහි මතින් ඉවත් කළ යුතු යැයි කියා සිතන්නියකි. අවංකවම ඒ වෙනුවෙන් ක්‍රියා කරන්නියකි. එහෙත් එල් ටී ටී ඊ සංවිධානය හුදෙක් ම නපුරු ත්‍රස්තවාදී සංවිධානයක් පමණක්ය යන එල් ටී ටී ඊ විරෝධීන් ගේ පොදු මුග්ධ අදහස ඇය නොදරන්නීය. ඒ එල්ටීටීඊ ය ඕපපාතික ප්‍රපංචයක් නොවේයැයි කියා ඇය දන්නා නිසා විය යුතුය. එල්ටීටීඊ ය වාර්ගික ප්‍රශ්ණයේ ඵලයක් මිස වාර්ගික ප්‍රශ්ණය එල්ටීටීඊ යේ ඵලයක් නොවේ යැයි කියා ඇය හොඳින්ම දන්නා නිසාවිය යුතුය. ඇය ග්‍රාම්‍ය සිංහලෝත්තමවාදීන්ට වඩා බෙහෙවින්ම දියුණු ය. දෙමළ ජනතාවට පිළිගතහැකි මට්ටමේ බලය සාධාරණව බෙදෙන ප්‍රජාතාන්ත්‍රික විසැඳුම් යෝජනාවක් යුද වදින්නට පෙර ඉදිරිපත් කරන්නැයි කියා ඇය ආණ්ඩුවලින් ඉල්ලා සිටින්නේ එ හෙයිනි. යුද්ධයක් යනු හුදෙක් අවි හරඹයක් පමණක් නොවන බවත් වාර්ගික ගැටලුවක් තුළදී එවැනි අවි හරඹවලට ලැබෙන්නේ ඉතා කුඩා අවකාශයක් බවත් එයද සංකීරණ දේශපාලන ක්‍රියාවලියක අල්ප අවස්ථාවක් හැටියට පමණක් බවත් ඇතැම් විට ඇය නොදන්නවා නොවේ.

තවත් බොහෝ දෙනා මෙන්ම ඇය ද තාර්කිකව ඉදිරිපත් කරන මේ අදහස එල් ටී ටී ඊ ය මර්දනය කිරීමට ආණ්ඩු විසින් පිළිනොගත්තේ ඇයි?. වඩාත් නිවැරදිව වඩාත් නිශ්චිතව කියනවානම් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා නායකත්වය හොබවන වර්තමාන ශ්‍රී ලාංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එය පිළිනොගත්තේ ඇයි?. මෙම ප්‍රශ්නයට ඇය විසින් පිලිතුරු සෙවිය යුතුව තිබේ. ඇය තරමටම ඒ අදහස දරන ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ වත්මන් නායක වී ආනන්ද සංගරී මහතා ද ආණ්ඩුව සිය තාර්කික අදහස් ඉවත දමා ඇත්තේ මන්දැයි බැරෑරුම් ලෙස කල්පනාවට ගත යුතුය.

ආනන්ද සංගරී මහතා හෝ ගුණසේකර මෙනෙවිය මීට පිලිතුරු සොයා ගත්තත් නොගත්තත් එය එසේ වන්නේ මන්දැයි කියා අප විසින්වත් සොයා බැලීම වටී.

පිළිතුර සරලය. පෙනෙන හැටියට එය මෙසේය.

ජනවාර්ගික ප්‍රශ්ණය යනු මවාගත් බොරුවකි. දෙමළ සන්නද්ධ අරගලය අවිබලයෙන් මර්දනය කොට මුලිනුපුටා දැමිය හැකිය. එය මෙතෙක් කල් කරගන්නට බැරිවූයේ හරිහමන් නායකයෙකුට ඊට අවස්ථාවක් නොලැබීම නිසාය. එල් ටී ටී ඊ ය අතුරුදහන් වීමෙන් පසු ජනවාර්ගික ප්‍රශ්ණයද අතුරුදහන් වනු ඇත. විසැඳීමට ඊනියා ජනවාර්ගික ප්‍රශ්ණයක් ඉතිරිවන්නේ නැත. එ බැවින් අර දේශපාලන විසඳුම් අවශ්‍යවන්නේද නැත. මහින්දගේ සිංහබාහු නාඩගම යැයි කියන්නේ මෙන්න මේ ටිකටය. ඉතින් මහින්ද ගේ/සිංහලෝත්තමවාදීන්ගේ සිංහබාහු නාඩගම පෙන්වා අවසන් වන තෙක් වෙනත් ඔපෙරාවක් පෙන්වන්නට වේදිකාවේ ඉඩක් නැත. ඒ බව තිසරණී ගුණසේකර මෙනවිය හා ආනන්ද සංගරී මහතාගේ සාම උපක්‍රමවාදීන් ද තේරුම් ගත යුතුය.

නැගෙනහිර චන්ද විමසීමෙන් පසු මාස හතරෙන් අටෙන් නැත්නම් වසරකින් හෝ අවසන් ජයග්‍රහණයෙන් පසු මුලතිව් නගරයේ මැද තඩි සිංහ කොඩියක් සිටුවා චම්පික රණවක මහතා පවත්වනු ලබන වේගවත් විචිත්‍ර ධර්ම දේශනයට ද සවන් දී ඉන්පසු සාම පරාක්‍රම ඔපෙරාව නැරඹීමටද ශ්‍රී ලාංකික ජනරජයේ වැසියන් සූදානම්ව සිටිනවාදැයි මම නොදනිමි.

-----------------------------------------ප්‍රගීත් එක්නැලිගොඩ විසිනි